ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමය
இலங்கை கணக்காளர்கள் சேவைச் சங்கம்
SRI LANKA ACCOUNTANTS' SERVICE ASSOCIATION
Reg No : 324

2026.02.28

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමයේ
සියලුම සාමාජිකයින් වෙත,

**වාර්ෂික සාමාජික ගාස්තු ගෙවීම හා සාමාජික ලේඛනය යථාවත් කිරීම - 2026**

2024 වසරේ සිට ගෙවන ලද හා නොගෙවන ලද සමාජික ගාස්තු ඇතුලත්ව විධිමත් දත්ත පද්ධතියක් මේ වන විට අප සංගමයේ ගරු භාණ්ඩාගාරික විසින් යථාවත්ව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව සාමාජික ලැයිස්තුව පරික්ෂා කිරීමේදී බොහෝ සාමාජිකයින් පිරිසක් 2024 හා 2025 වර්ෂ සඳහා සාමාජික මුදල් ගෙවා නොමැති බව අනාවරණය විය.

තවද, අප සංගමයේ ව්‍යවස්ථාවේ අංක 13(b) වගන්තිය අනුව හිඟ සාමාජික මුදල් පවතින සාමාජිකයින් සඳහා කිසිදු අයුරක හිමිකමක් හෝ වරප්‍රසාදයක් හිමි නොවන බැවින්, 2024 වසරට පෙර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවාව සඳහා පත්වීම් ලද අප සංගමයේ සාමාජිකයින් සඳහා 2024 හා 2025 වර්ෂ සඳහා හිඟ සමාජික මුදල් ගෙවීම සඳහා 2026 මාර්තු 15 දින මධ්‍යම රාත්‍රිය දක්වා අවස්ථාව ලබා දීමටත් ඒ අනුව හිඟ සාමාජික මුදල් සියල්ල ගෙවා අවසන් සාමාජිකයින්ට පමණක් 2026 මාර්තු 20 පැවැත්වෙන වාර්ෂික මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීමටත් විධායක කමිටුව ඒකමතිකව තීරණය කර ඇත. ඒ අනුව යාවත්කාලීන කරන ලද සාමාජික ලේඛනය 2026 මාර්තු 18 දිනට පෙර සංගමයේ නිල වෙබ් අඩවිය මගින් හා වට්ස්ඇප් සමූහය මඟින් සාමාජිකයින් වෙත දැනුම් දෙනු ඇත.

2024 ජනවාරි 01 න් පසු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳුනු නිලධාරින් තම සාමාජික ගාස්තු පත් වීම් දිනය අනුව 2024 හා 2025 වර්ෂයට ගෙවීම් කිරිම සාමාජිකත්වය තහවුරු කිරිමට ප්‍රමාණවත් බව සඳහන් කරමි.

තවද වාර්ෂික සාමාජික ගාස්තුව වන රුපි. 2,400.00ක මුදල පහත බැංකු ගිණුම වෙත බැර කර ලබා ගන්නා ලදුපත භාවිතාකර අපගේ නිල වෙබ් අඩවිය වෙත පිවිස (www.sacsa.lk) ඔබටම ඔබගේ සාමාජිකත්වය යාවත්කාලීන කල හැකි බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

| | |
|---|---|
| Bank Account Number | - 0000007365 |
| Bank Account Name | - Sri Lanka Accountants' Service Association. |
| Name Of the Bank | - Bank of Ceylon |

නියමිත හිඟ මුදල් ද සහිතව ඔබගේ සාමාජික මුදල් ගෙවා 2026 වර්ෂයේ වාර්ෂික මහ සභා රැස්වීම සාර්ථකව පැවැත්වීම සඳහා සහයෝගය ලබා දෙන මෙන් විධායක කමිටුවේ නියෝගය පරිදි ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.ඩබ්.එස්.කේ. වන්නිනායක,
ලේකම්,
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමය.

President : D.M. Weerasekara
Contact : 071 801 16339
Secretary : W.M.W.S.K. Wanninayake
Contact : 071 689 1436
Treasurer : P.M.N. Chaminda
Contact : 071 829 7012

Postal Address : No.401/3, Bamunugedara, Kurunegala.
E-Mail : slaccsa324@gmail.com